## සොබාදම් මවුනි!

සිසිල ගෙනදුන් තුරු ලතාවන්
හුදකලාවේ මැලවිලා
දියත සැනසූ වැසි කුමාරිය
සුනිල සළුපොට සඟවලා
සරලි නගමින් ගැලූ ගංගා
මිහිතලය මත වියැලිලා
සොබාදම් මව අහෝ නිසලයි
සුන්දරත්වය වියැකිලා

නීල ගුවනෙහි තාරකාවන්
සෝ දුකින් මුකුලිත වෙලා
දසත විසිරුණු දුම් වළා මැද
සඳ කුමාරිය තනිවෙලා
යදම් බැඳ මහපවුරු ඉදිකොට
මිනිස්කම සිරගත වෙලා
සොබාදම් මැණියනි කිව මැන
කිමද ඔබ අද ගොළුවෙලා?

♦ ***චතුරිකා අනුකා දොඩම්පෙ***
බඳගිරිය මහා විද්‍යාලය
හම්බන්තොට Sri Lanka


## මගේ උරුමය

දුටු ගැමුණු රජතුමා
රුවන්වැලි සෑය සෑදූ නිසා
මම ඉතා සතුටිනා
වඳිමි සැමකල් හිස නමා

මහ පැරකුම් රජතුමා
සෑදූ පැරකුම් සමුදුරේ
දියෙන් ගොවිතැන් සරුවුණේ

කාශ්‍යප රජතුමා
සෑදූ සීගිරි නිසා
ලොවම මගෙ රටට ගරුකළා
මෙය මගේ උරුමය තමා
රකිමි මම එය සැමදිනා

♦ ***රංසි උත්පලා***
*ශාන්ත ජෝන් බොස්කෝ මහ විදුහල*
*කලුඅග්ගල* Sri Lanka




## World's Most Dangerous Motorway
## අද ලොව ඇති ඉතාමත් භයානක මහා මාර්ගය




The North Yungas Road in Bolivia is the world's most dangerous motorway. Up to 300 people die every year. on average along the road which winds its way from the capital La Paz along the edge of sheer gorges and frightening 300m (1,000ft) drops. In 1983 a bus veered off the road and into a canyon, killing more than 100 passengers.

**බො**ලීවියාවේ උතුරු යුංගා මාර්ගය ලොව ඇති භයානකම මහාමාර්ගය ලෙස සැලකේ. වසර කට ඒ මාර්ගයේ ගමන්ගත් මගීහු 300 කට වැඩි පිරිසක් මිය යති. අග නගරය වන ලා පාස් හි සිට මේ පාර වැටී ඇත්තේ අඩි 1000 කට වඩා පාතාල බෑවුමක් ඇති අයිනක් දිගේය. 1983 දී එම පාරෙන් ඉවතට විසිවුණු බස් රථයක් පල්ලමට පෙරළී එහි සිටි මගීන් 100 කට වඩා මිය ගොස් ඇත.

♦ *Auntie Ramani* (*රමණි නැන්දා*)

### ඉර නැන්දයි හඳ මාමයි

නිල් අහසේ වළාකුලේ
ඉර නැන්දා බලා ඉන්නවා
පුංචි අපට එළිය බෙදනවා
පුංචි අපේ හිරු කුමරිය වෙනවා
රෑ අහසේ වළාකුලේ
හඳ මාමා බලා ඉන්නවා
පුංචි අපේ අඳුර මකනවා
පුංචි අපට පහනක් වෙනවා
නිල් අහසේ ඉර නැන්දයි
රෑ අහසේ හඳ මාමයි
පුංචි අපට එළිය ගෙනෙනවා
පුංචි අපේ යාළුවෝ වෙනවා



♦ ***සෙව්වන්දි අමාලිකා***
රෝමානු කතෝලික කණිෂ්ඨ විදුහල
**කඩවත** Sri lanka

ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි
ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC** ගිණුමක් අරඹන්න !
උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***


පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්‍යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත-කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණිය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***


ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා*** :

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**



## පොතක් පතක්
## පසුගිය වසන්ත කාලේ

***කර්තෘ - රංජිත් විමලනාථ***
**ප්‍රකාශනය - දයාවංශ ජයකොඩි සහ සමාගම**






**ර**න්ජිත් විමලනාථ යනු ප්‍රංශයේ අගනුවර පැරිසියේ වසර විසිහතරක් පමණ කාල යක් වෙසෙමින් විවිධ කලා කටයුතුවල නිරතවන ලේඛක යෙකි. කවියෙකි. ඔහු විසින් ලියන ලද, ***පසුගිය වසන්ත කාලේ*** යන නමින් යුතු සිය ප්‍රථම නවකතාව මේ මාසයේ දී දොරටවඩනු ලබන්නේ ය. ඇතුගල්පුරයේ ගමක ඓතිහාසික කරුණක් ද කේන්ද්‍ර කරගෙන ඔහු මෙම යොවුන් ආදර අන්දරය ගොතා ඇත.

70 සහ 80 දශකයන්හි ශ්‍රී ලංකාවේ වූ දේශපාලනික විපර්‍යාසයන් නිසා එහි අප සමාජය උඩු යටිකුරුව ගිය බව කාටත් පැහැදිලි ය. පැව තුණු සාමකාමී අල්පේච්ඡ ලාංකීය ජීවන රටාව ලිහී ගොස් ඒ වෙනුවට මුදල් පසුපස ඉවක් බවක් නැතිව දුවන යාන්ත්‍රික සමාජයක් බිහිවීය. මහාචාර්‍ය සරච්චන්ද්‍ර **ධර්මිෂ්ඨ සමාජයක්** වැනි පොත් ලියා පැහැදිලි කළේ ද මේ කරුණයි.

ඒ සමාජයේ වඩාත් පීඩාවට හා දුර්භාග්‍යයට මුහුණ දෙන්නේ තරුණපෙළ ය. ඔවුන්ගේ ප්‍රශ්න තේරුම් ගත හැකි අය ඉතා අල්ප වන අතර දේශපාලනික වශයෙන් ද ඔවුන් සිටිනා අර්බුදයන් ගෙන් ගොඩ ඒමට ලැබෙන රැකුලක් ද නැති තරම් ය. ඒ අතරින් දෙදෙනෙකු ස්වෝත්සාහයෙන් ජීවිතය ජයගැන්ම ***පසුගිය වසන්ත කාලේ*** නවකතාවේ තේමාව බවට පත්ව ඇත.

ශ්‍රීලාංකිකයින් වෙසෙන බොහෝ යුරෝපීය රටවල් අතරින් ප්‍රංශයේ වෙසෙන සිංහළ ජනසමාජයේ ලේඛක ලේඛිකාවන් රැසක් සිටින බව ඔවුන් වරින්වර ලියා පළකරන සාහිත්‍ය කෘතීන් නිසා අපට දැනී ඇත. සිංහල නව කතා සහ කෙටිකතා බිහිවීම සහ එම සමාජයන්හි අභ්‍යන්තරයද කතා තේමාවන් මගින් පාඨකයන්ට හෙළිදරව් කිරීම ලේඛකයාගේ කාර්‍ය්‍ය වන්නේය. ***පසුගිය වසන්ත කාලේ*** නවකතාව තුළින් රංජිත් විමලනාථ පැරිස් නගරයේ වටපිටාව හා ජීවන රටාවද සිය නවකතාවේ චරිතයන් ආශ්‍රයෙන් කියවන අයගේ සිත්හි සටහන් කරන්නට මහන්සි ගෙන ඇති බව පෙනේ.

අද දවසේ ශ්‍රීලංකාවේ යොවුන් ආදර කතාවන් බෙහෙවින් අළෙවි වන බවත්, ඒවාටම ඇලුණු ගැලුණු පාඨක පිරිසක් සිටින බවත් අපට වැටහේ. විශේෂයෙන් සිංහලට ලැදි සිංහල පාඨක පිරිස් වැඩිය සිටින විදේශීය රටවල එම නවකතා මගින් ඔවුන්ගේ කියවීමේ පවස සංසිඳවීම සිදුවන අතර සිංහල බස නොනැසී පව තින්නටද එය අප්‍රමාණ පිහිටක් වන බවද මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

රංජිත් විමලනාථ ලේඛකයාණන්ගේ ***පසුගිය වසන්ත කාලේ*** නවකතාව 2009 ජනවාරි 11 වෙනි දින ප්‍රංශයේ Paris 17 හි 27 Rue De Armille වීදියේ Saint Ferdinand Des Ternes නම් ස්ථානයේදී දොරටවැඩීමට නියමිතව ඇත.

♦ ***කීර්ති***

# විදුසෙත උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව 11 වන ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය

**ශ්‍රී** ලංකාවේ මාවතගම ආරම්භකර ඇති විදුසෙත උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පදනම විසින් වසරක් පාසා පවත්වනු ලබන ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පසුගිය දෙසැම්බර් 26 වන සිකුරාදා මාවතගම මහාවිද්‍යාලීය වික්‍රමසිංහ ශ්‍රවනාගාරයේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මහාචාර්‍ය දයා අමරසේකර මහතාගේ ප්‍රධානත්ව යෙන් වූ එම උත්සවයට මාවතගම ප්‍රාදේශීය ලේකම් යූ පී ආර් ආරියරත්න මහතා මාවතගම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ ඩී සී රණසිංහ මහතා සහ මාවතගම ප්‍රිදේශීය සභාවේ සභාපති සනත් මීගොල්ල මහතාද සහභාගිවූහ.

විදුසෙත ශිෂ්‍යත්ව පදනම මගින් දැනට ශිෂ්‍ය ශිෂ්‍යාවන් **450** කට ශිෂ්‍යත්ව ප්‍රදානය කර පවත්වාගෙන යන අතර මාස්පතා ආධාර ලබන විශ්වවිද්‍යාල සිසුදරුවෝ **250** පමණ සිටිති.

ලංකාවිත්ති පුවත්පත කියවන එක්සත් රාජධානියේ පාඨකයින් ද මෙම විදුසෙත ශිෂ්‍යත්ව පදනමට බැඳී ශ්‍රී ලංකාවේ වෙසෙන ඉගෙනීමට හපන් ගම්බද දිළිඳු සිසුන්ට ආධාර කරන බවද විදුසෙත ශිෂ්‍යත්ව පදනමේ ගරු සභාපති සරත් කරුණානායක මහතා කෘතඥපූර්වකව ලංකාවිත්තියට දන්වා සිටියි.

විදුසෙත පදනමේ පරමාර්ථය සහ කෙරෙන සේවා පහත දැක්වේ.

## ***දිළිඳු දරුවෙකුගේ ඉගෙනීමට අත දෙන්න!***
## *විදුසෙත පදනමට ආධාර කරන්න!*

**බලවත් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසු දරුවෙකුගේ උසස් අධ්‍යාපනයට උපකාර කිරීමට කැමති පරිත්‍යාග ශීලීන්ට ඒ සඳහා අවස්ථාව සළසාදීමට රජයේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන යක් වන මාවතගම අරම්පොලවත්ත විදුසෙත උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පදනම** බලා පොරොත්තු වේ.

මෙම පදනම මගින් ගම්බද ප්‍රදේශවල දිළිඳු පවුල්වලින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පිවිසුණු සිසු දරුදැරියන් විශාල සංඛ්‍යාවකට විවිධ පළාත්වලින් හා රටවල් වලින් ඉදිරිපත් වූ භාරකරුවන් මාර්ගයෙන් ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

ජාතියේ අනාගතය බාරගැනීමට සිටින දරුවන්ගේ දැස්පෑදීමට උපකාර කිරීම මහත් කුසල කර්මයකි.

මාපිය භාරකාරත්වය යටතේ සිසුදරුවෙකු භාරගැනීමට හෝ මෙම ජාතික පුණ්‍ය සේවා අරමුදලට ආධාරකිරීමට හෝ ඉදිරිපත්වන ලෙස පරිත්‍යාග ශීලීන්ට විදුසෙත ආයාචනා කරයි.

**විමසන්න**
**සභාපති**
**විදුසෙත උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පදනම**
**190 අරම්පොළ වත්ත**
**මාවතගම Sri Lanka**
**දුරකථනය 037-99085**
**e-mail**
**viduedu@sltnet.lk**